2026.09.12 චක්‍රලේඛ අංක 72/2026

සියලුම දිසා බාලදක්ෂ කොමසාරිස්වරුන් වෙත,

**සුපිපි බාලදක්ෂ අංශය දිසා මට්ටමින් ස්ථාපිත කිරීම.**

**1.හැදින්වීම**

වයස අවුරුදු 3-5 අතර පෙර පාසල් දරුවන් සඳහා විශේෂිත වූ නව බාලදක්ෂ අංශයක් ලෙස "සුපිපි බාලදක්ෂ අංශය" ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය මගින් හඳුන්වා දී ඇත., දිවයින පුරා සියලුම බාලදක්ෂ දිසා තුළ අදියරෙන් අදියර ස්ථාපිත කිරීමට යෝජිතය. සුපිපි බාලදක්ෂ අංශය ස්ථාපිත කිරීම සඳහා දිසා මට්ටමින් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ මාර්ගෝපදේශනය මෙම චක්‍රලේඛය මගින් සපයනු ලැබේ.

**2.වයස් කාණ්ඩය**

සුපිපි බාලදක්ෂ අංශය සඳහා අයත් වන්නේ වයස අවුරුදු 3 - 5 අතර පෙර පාසල් දරුවන් වේ. පෙර පාසල් මට්ටමින් "සුපිපි කැල" ලෙස කණ්ඩායම් ගොඩනගා, එහි කාණ්ඩ ලෙස "රේණු" (කහ, රතු, දම්, නිල්) නම් කෙරේ.

**3.සුපිපි අංශයේ අරමුණු හා පරමාර්ථ**

පෙර පාසල් දරුවන්ගේ වයසට ගැළපෙන ක්‍රියාකාරකම් මගින් ඔවුන්ගේ අත් හා සිත් සමව වර්ධනය කර, යහපත් චරිත ගුණාංග ගොඩනැගීම සුපිපි බාලදක්ෂ අංශයේ ප්‍රධාන ඉලක්කයයි. ප්‍රධාන පරමාර්ථ පහත පරිදි වේ.

- සමාජ කුසලතා හා ස්වයං විශ්වාසය වර්ධනය කිරීම
- යහපත් චරිත ගුණාංග හා පරිසර හිතකාමී හැසිරීම් වර්ධනය කිරීම
- මූලික ජීවිත කුසලතා හා ශාරීරික/මානසික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම
- අනාගත සිගිති හා බාලදක්ෂ අංශ සඳහා දරුවා සූදානම් කිරීම
- මව්පිය සහභාගීත්වය හා පවුල් සම්බන්ධතා ශක්තිමත් කිරීම

**4.සුපිපි බාලදක්ෂ ක්‍රමවේදය**

ලෝක බාලදක්ෂ ව්‍යාපාරයේ පිළිගත් මූලික හර පද්ධති හා මූලධර්ම ඔස්සේ, පහත ක්‍රමවේද මගින් සුපිපි බාලදක්ෂ අංශය ක්‍රියාත්මක වේ

1. පොරොන්දුව (නීතියක් රහිතව),
2. ක්‍රියාකාරකම් මගින් ඉගැන්වීම,
3. පෞද්ගලික ප්‍රගතිය,
4. කණ්ඩායම් ක්‍රමය,
5. වැඩිහිටි සහාය,
6. සංකේතාත්මක රාමුව,
7. ස්වභාවික පරිසරය
8. ප්‍රජා සහභාගීත්වය.



65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka.
Tel : +94 112 433131 / +94 112 433512
Fax : +94 112 433131
E-mail : slsaheadq@gmail.com
Web : www.scout.lk

**5. සුපිපි බාලදක්ෂයින්ගේ පූර්ණ සංවර්ධනයට බලපාන ඉගෙනුම් ක්ෂේත්‍ර/ සංවර්ධන ක්ෂේත්‍ර.**

1. සෞඛ්‍යය හා ශාරීරික සංවර්ධනය
2. සමාජීය හා චිත්තවේග සංවර්ධනය
3. පරිකල්පන සංවර්ධනය
4. මුල් සාක්ෂරතා සංවර්ධනය
5. සෞන්දර්යාත්මක හා නිර්මාණාත්මක සංවර්ධනය

**6. සුපිපි බාලදක්ෂ අංශය**

1. සුපිපි කැල
2. සුපිපි රේණු(කහ,රතු,දම්,නිල්)
3. වයස අවුරුදු 3-5
4. සුපිපි බාලදක්ෂ පොරොන්දුව- "අපි සතුටින් සිටිමු"
5. සුපිපි බාලදක්ෂ නීතිය - "අපි ඔක්කොම යාළුවෝ"
6. සුපිපි බාලදක්ෂ ජයඝෝෂා - පිබිදෙමු ///
7. තේමාව - සතුටින් පිබිදෙමු
8. ආදර්ශ පාඨය - "ආදරය ලබයි- ආදරය කරයි"
9. වර්ණය - තැඹිලි පාට
10. සුපිපි බාලදක්ෂ නිලඇඳුම
    I. සුපිපි බාලදක්ෂ පදක්කම් සහිත තැඹිලි පාට වර්ණ සහිත ටීෂර්ටය
    II. පෙර පාසලේ භාවිත වර්ණ දෙකක් සහිත කර ලේන්සුව

**7.පදක්කම් හා අවශ්‍යතා**

සුපිපි බාලදක්ෂ අංශය සඳහා ප්‍රගතිශීලී පදක්කම් හතරකින් යුතුව සකස් කර ඇත. සම්පූර්ණ පුහුණු කාලය අවම වශයෙන් වසරකි.

| පදක්කම | අවම පුහුණු කාලය | අවම රැස්වීම් ගණන |
|---|---|---|
| 1. සාමාජික පදක්කම | මාස 01 | 04 |
| 2. පියුම පදක්කම | මාස 05 | 10 |
| 3. සුවඳ පදක්කම | මාස 05 | 10 |
| 4. සම්බන්ධීකරණ පදක්කම | මාස 01 | 04 |

පදක්කම් ලබාදීමට අදාළ නිර්ණායක හා විස්තරාත්මක මාර්ගෝපදේශය සුපිපි බාලදක්ෂ නායක අත්පොතේ දක්වා ඇත.

**8.සුපිපි බාලදක්ෂ අංශය ස්ථාපිත කිරීම සඳහා දිසාවේ වගකීම්**

සුපිපි බාලදක්ෂ අංශය දිසා මට්ටමින් ස්ථාපිත කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග දිස්ත්‍රික් කොමසාරිස්වරයා විසින් සම්පාදනය කළ යුතුය.

1. පෙර පාසල, කණ්ඩායමක් (Group) ලෙස නිල වශයෙන් ලියාපදිංචි කිරීම.
2. සුපිපි බාලදක්ෂ කරලේන්සුව සඳහා දිස්ත්‍රික් මට්ටමින් අනුමැතිය ලබාගැනීම.
3. සුපිපි අංශය සඳහා විශේෂිත සහකාර දිස්ත්‍රික් කොමසාරිස්වරයෙකු (ADC - Supipi) පත් කිරීම.
4. ජාතික පුහුණු කණ්ඩායමේ (National Training Team) මාර්ගෝපදේශනය යටතේ පළමු අදියර (Phase I) පාඨමාලාව සංවිධානය කර පැවැත්වීම.

**වැඩිදුර විස්තර සඳහා**

සුපිපි බාලදක්ෂ අංශය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීම් අවශ්‍ය වන්නේ නම්, **සහකාර ප්‍රධාන කොමසාරිස් (ACC) චමිලා කුලසේකර** *(සුපිපි බාලදක්ෂ හා සිඟිති බාලදක්ෂ අංශය ) මහත්මිය හා සම්බන්ධ වන්න.*

මෙයට,

බාලදක්ෂ සේවයේ නියුතු,

චමිලා කුලසේකර
සහකාර ප්‍රධාන කොමසාරිස්

Chamila Kulasek...
Assistant Chief Commissioner
(Supipi Scouts and Singithi Scouts)
Sri Lanka Scout Association
65/9, Sir Chittampalam A Gardiner M...
Colombo 02, Sri Lanka

නීතිඥ මනෝජ් නානායක්කාර
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

පිටපත්:

- ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයෙහි ගරු සභාපති, විධායක සභා සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික
- ජාතික මූලස්ථානයෙහි සියලුම කොමසාරිස්වරුන්
- කාර්යාල ලිපිගොනුවට

Manoj Nanayakkara
(Attorney-at-Law)
Chief Commissioner
Sri Lanka Scout Association
65/9, Sir Chittampalam A Gardiner Mw,
Colombo 02, Sri Lanka